එච්. එම්. විජිත හේරත්, පා. ම.
எச். எம். விஜித ஹேரத், பா. உ.
H. M. Vijitha Herath, M. P.
විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍ය
வெளிநாட்டு அலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலாத்துறை அமைச்சர்
Minister of Foreign Affairs, Foreign Employment and Tourism

## සිංහල සහ දමිළ අලුත් අවුරුද්ද වෙනුවෙන් විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගේ සුබපැතුම් පණිවුඩය

සූර්යයා මීන රාශියෙන් මේෂ රාශියට සංක්‍රමණය වීමත් සමඟ උදාවන සිංහල සහ දමිළ අලුත් අවුරුද්ද, ශ්‍රී ලාංකේය සංස්කෘතික අනන්‍යතාවය විදහාපාන ප්‍රධාන උත්සවය වේ. සොබාදහම සමඟ බැඳුණු මෙම සංස්කෘතික මංගල්‍යය, සහජීවනය සහ සාමූහිකත්වය පෙරදැරිකරගත් සියලු ශ්‍රී ලාංකිකයන්ගේ හදවත් යා කරන පාලමක් බඳුය.

ලෝකය පුරා විසිරී සිටිමින් නව වසර උදාව සමරන ශ්‍රී ලාංකික, ඔබ මව්බිමෙන් සහ තම සමීපතමයන්ගෙන් දුරස්ව, අවුරුදු සැමරීම අසීරු සහ සංවේදී අත්දැකීමක්. එසේ වුවද, ඔබ විදෙස්ගතව සිටින්නේ ඔබේ දරුවන්, ඔබේ දෙමාපියන්, ඔබේ නෑ හිතමිතුරන්ගේ අවශ්‍යතා සහ සිහින සැබෑ කිරීම වෙනුවෙන් බව අපි දනිමු. ඔබ දරන ඒ අප්‍රතිහත ධෛර්යය සහ කැපවීම අපේ මාතෘභූමියට විශාල ජවයක් සහ ශක්තියක් බව මම කෘතඥපූර්වකව සිහිපත් කරමි.

ඔබ වෙසෙන රටේ සාමූහිකව සංවිධානය කරමින් අවුරුදු උත්සව හරහා ශ්‍රී ලාංකේය සංස්කෘතියේ අභිමානය එම රටවලට ප්‍රදර්ශනය කිරීමටත්, ශ්‍රී ලාංකේය දරු පරපුරට අවුරුදු සිරිත් විරිත් හුරු කිරීමටත් ඔබ ගන්නා උත්සාහය බෙහෙවින් අගය කරමි. එමඟින් ඔබ සැබෑ ලාංකිකත්වය සහ දේශමාමකත්වය ප්‍රදර්ශනය කරන බව මාගේ විශ්වාසයයි.

එමෙන්ම, මේ අලුත් අවුරුදු සමයේ ශ්‍රී ලංකාවේ සංචාරයේ නිරතව සිටින සංචාරකයන් ද මම ඉතා ආදරයෙන් පිළිගනිමි. ලෝකයටම අසීරු කාලසීමාවක ඔබ ශ්‍රී ලංකාව තෝරා ගැනීම අප අගය කරන අතර, අපේ සංස්කෘතියේ සුවඳ විඳගනිමින් අලුත් අවුරුදු චාරිත්‍ර වාරිත්‍ර "බක් මහ අසිරිය" අත්විඳීමටත් මම ඔබට ආරාධනා කරමි.

උදාවූ මේ අලුත් අවුරුද්ද සියලු ශ්‍රී ලාංකිකයන්ට, විශේෂයෙන් විදෙස්ගතව වෙසෙන ශ්‍රී ලාංකිකයන්ට, ඔවුන්ගේ පවුලේ සාමාජිකයන්ට, විදේශීය අමුත්තන්ට, සාමය, සතුට සහ සෞභාග්‍යය පිරි සුබ අලුත් අවුරුද්දක් වේවායි ප්‍රාර්ථනා කරමි!



**විජිත හේරත්**
විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක අමාත්‍ය
2026 අප්‍රේල් 14 දින

කාර්යාලය/அலுவலகம்/Office: +94-11-2430221, +94-11-2445498 ෆැක්ස්/பெக்ஸ்/Fax No. : +94-11-2430222
වෙබ් අඩවිය/வலைத்தளம்/Website: www.mfa.gov.lk - ඊමේල්/மின்னஞ்சல்/Email: fmo@mfa.gov.lk
විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය, ජනරජ ගොඩනැගිල්ල, කොළඹ 01, ශ්‍රී ලංකාව
வெளிநாட்டு அலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலாத்துறை அமைச்சு, குடியரசுக் கட்டிடம், கொழும்பு 01, இலங்கை.
Ministry of Foreign Affairs, Foreign Employment and Tourism, Republic Building, Colombo 01. Sri Lanka.